# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## ලංසු සඳහා ආරාධනාව (IFB)

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත සත්ව ආහාර/අතිරේක සැපයීම සහ බෙදාහැරීම සඳහා ප්‍රසම්පාදනය - 2026 වර්ෂය

**කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය. SLA/S&T/03/INTERIM RATIONS/ANIMAL/2026 (08)**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන්, බත්තරමුල්ල, අකුරේගොඩ පාර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2026 ජනවාරි 01 සිට 2026 දෙසැම්බර් 31 දක්වා වන කාල සීමාව තුළ පහත දක්වා ඇති කඳවුරු වෙනුවෙන් සත්ව ආහාර/ අතිරේක සැපයුම් සඳහා ප්‍රසම්පාදන ලංසු කැඳවනු ලැබේ.

| කාණ්ඩය | කඳවුර / මූලස්ථානය |
|---|---|
| සුනඛ ආහාර | රත්මලාන |
| | පනාගොඩ |
| | අනුරාධපුර |
| | හිගුරක්ගොඩ |
| | පලාලි |
| | මුලතිව් |
| | කිලිනොච්චි |
| | දියතලාව |
| අශ්ව ආහාර/ අතිරේක ආහාර | දියතලාව |

2. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි 3.1.2 වගන්තිය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියාපටිපාටිය හරහා ලංසු තැබීම සිදු කෙරේ. දේශීය ලංසුකරුවන්ට පමණක් ලංසු තැබීමට අවසර ඇත. සත්ව ආහාර/අතිරේක අයිතමවල එක් එක් කාණ්ඩයේ සියලුම විස්තර සහ පිරිවිතර ලංසු ලේඛනයේ සපයනු ලැබේ.

3. ලංසුකරු අසාධු ලේඛනගත කර නොතිබිය යුතු අතර, පහත සඳහන් අවම සුදුසුකම් නිර්ණායක සපුරා තිබිය යුතුය.

   3.1 පෙර වසර දෙක (02) තුළ ඕනෑම එක් (01) මූල්‍ය වර්ෂයක් සඳහා සත්ව ආහාර සැපයුම් ක්ෂේත්‍රයේ අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රු. 500,000.00 ක් අදාළ මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුය.

   3.2 මූල්‍ය ප්‍රකාශන හරහා තහවුරු කළ යුතු අවම ද්‍රවශීල වත්කම් රු.500,000.00 (ලංසු ඉදිරිපත් කළ දිනය දක්වා මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව) (අතැති මුදල්, බැංකුවේ මුදල්, කෙටි කාලීන ආයෝජන සහ ගිණුම් ලැබිය යුතුය.).

   3.3 ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක්, මූල්‍ය ආයතනයක් විසින් සහතික කරන ලද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද (මෙම ටෙන්ඩරය සඳහා පමණක්) අවම වශයෙන් රු. 500,000.00 ක ණය පහසුකම් සැපයීමට හැකියාව පැවතිය යුතුය.

   3.4 සත්ව ආහාර/අතිරේක සැපයීම සඳහා ලංසුකරු සතුව ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් (ලංසුකරුගේම හෝ බදු/කුලී පදනම මත) තිබිය යුතුය.

   3.5 පසුගිය වසර පහ (05) තුළ සත්ව ආහාර සැපයුම් පිළිබඳ සමාන අත්දැකීම්, ඕනෑම රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකට සමාන ආහාර ද්‍රව්‍ය (තොග/ සිල්ලර ව්‍යාපාර) සැපයීමට අදාළ කොන්ත්‍රාත්තු සිදුකර තිබීම.

   3.6 සියලුම ලංසුකරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය.

4. ලංසු ලේඛන නිකුත් කිරීමේ දිනයන් සහ වේලාවන්, ලංසු ලැබීම සහ ලංසු විවෘත කිරීම පහත පරිදි වේ:

   අ. ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කිරීම - 2025.10.27

   ආ. ලංසු ලේඛන නිකුත් කිරීමේ අවසාන දිනය සහ වේලාව - 2025.11.17 දින ප.ව. 3.00 දක්වා

   ඇ. ලංසු ලේඛන ඉදිරිපත් කිරීම/මුද්‍රා තබන අවසාන දිනය සහ වේලාව - 2025.11.18 දින පෙ.ව. 11.00 දක්වා

5. පූර්ව ලංසු රැස්වීමක් 2025.11.04 වන දින පෙ.ව. 11.00 ට සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂක මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල යන ලිපිනයේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේදී පැවැත්වේ.

6. ලංසු තැබීම අවසන් වන වේලාවෙන් මිනිත්තු 30 කට පසු, බත්තරමුල්ල, අකුරේගොඩ පාර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ, යුද්ධ හමුදා මූලස්ථාන රඨගාලේදී, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

7. ආපසු නොගෙවනු ලබන ලංසු ගාස්තුවක් ගෙවීමෙන් පසු, ලංසුකරුවන්ට 12 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයෙහි සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. එක් එක් ස්ථානය / කඳවුර සඳහා අදාළ ආපසු නොගෙවනු ලබන ලංසු ගාස්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි 6.2 වගන්තියට අනුකූල විය යුතුය. අදාළ ආපසු නොගෙවන ලංසු ගාස්තු පිළිබඳ උප ලේඛනය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබා ගත හැකිය.

8. ලංසු ඉදිරිපත් කිරීම සඳහා, ලංසුකරුවන් ලංසු ලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍ර පමණක් භාවිතා කළ යුතුය. ඉහත 4 වන ඡේදයේ දක්වා ඇති පරිදි නියමිත දිනය හා වේලාවට පෙර, ලියාපදිංචි තැපෑලෙන් යැවීමට හෝ බත්තරමුල්ල, අකුරේගොඩ පාර, ශ්‍රී ලංකා හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ රඨ ගාල අසල ස්ථාපිත කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම සඳහා මුල් මුද්‍රා තැබූ ලංසුව සහ අනුපිටපත් මුද්‍රා තැබූ ලංසුව වෙන වෙනම මුද්‍රා තැබූ කවරයක ඉදිරිපත් කළ යුතුය.

9. ලංසු 2026.02.18 දක්වා වලංගු විය යුතුය.

10. ඉදිරිපත් කරනු ලබන ලංසු සමඟ 2026.03.18 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණ ඇපකරයක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර, එය යුද්ධ හමුදාපති නමින් යොමු කළ යුතුය. ලංසු සුරක්ෂණ ඇපකරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කළ යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි මුල් ස්වරූපයෙන් (බැංකුවේ මුල් ලිපි ශීර්ෂය මත) කොන්දේසි විරහිත, අවලංගු කළ නොහැකි සහ ඉල්ලූ සැනින් ලබාදිය හැකි ඇපකරයක් විය යුතුය . නිශ්චිත ලංසුවක් සඳහා ලංසු ඇපකරයේ ප්‍රමාණය දැක්වෙන උප ලේඛනය 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නියම කර ඇති පරිදි සකසා ඇති ලංසු ලේඛනය සමඟ සපයනු ලැබේ.

11. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය අතිරේක විස්තර වෙතොත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි අතර, 2025.10.27 සිට 2025.11.17 දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා පහත 12 ඡේදයේ දක්වා ඇති ලිපිනය සඳහන් කාර්යාලයේදී ලංසු ලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැක.

12. ඉහත සඳහන් ලිපිනය වන්නේ;

**අවධානය : අධ්‍යක්ෂ, සැපයුම් සහ ප්‍රවාහන**

**ලිපිනය : යුද්ධ හමුදාපති,**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.**

**දුරකථන : 011 2302569, 011-2302568**

**ඊමේල් :** dtesandt@army.lk
dteofsuptender@gmail.com

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**සත්ව ආහාර/අතිරේක ප්‍රසම්පාදනය - 2026 වර්ෂය,**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව.**

**2025.10.26**